www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 75 වසරකට පෙර: ජර්මනිය ඩෙන්මාර්කය හා නෝර්වේ රට ආක්‍රමනය කරයි

## 75 years ago: Germany invades Denmark and Norway

ස්වීඩනයේ යපස් ජර්මනියට නැව්ගත කිරීම අවහිර කල හැකි වන පරිදි බ්‍රිතාන්‍ය, උතුරු මුහුදේ නෝර්වේජියානු වරායන් රක ගැනීම වැලැක්වීම පිනිස ජර්මානු හමුදා 1940 අප්‍රේල් 09දා ඩෙන්මාර්කය යටත් කරගෙන නෝර්වේ රට ආක්‍රමනය කලේය. බ්‍රිතාන්‍ය නාවික හමුදාව උතුරු නෝර්වේහි නාවික වරාය අසල බිම් බෝම්බ තුනක් වැලලුවේ, ජර්මානු හමුදා නෝර්වීජියානු වෙරලට ගොඩබැසීමට යන්තම් දිනකට පෙරය. ඒ නෝර්වේ යපස් නැව්ගත කිරීම අවහිර කිරීම පිනිස ය.

උතුරු ඩෙන්මාර්කය පැරෂූට් හමුදාවල අනසකට යටත්කර ගනිද්දී අප්‍රේල් 09දා උදෑසන ජර්මානු පැන්සර් හමුදා සේනාංක රටේ දකුනු කොටස හරහා ඇදී ගියේය. කුඩා නැව් තුනක් කෝපන්හේගන් වරායට ඇතුල් වෙමින් අගනුවර සියතට ගත්හ. මේ සියල්ල සිදුවූයේ සුලු නැත්නම් කිසිදු ප්‍රතිරෝධයක් හෝ නොමැතිවය. උදෑසන 6 වෙද්දී ඩෙන්මාර්කයේ රජු ජර්මානුන්ට යටත් විය. ඩෙන්මාර්කය අල්ලා ගැනීම උතුරු මුහුද හා බෝල්ටික් අතර සමුද්‍රසන්ධිය පාලනය කිරීමට අවස්ථාව සැලසීය. එමගින් ජර්මනියේ වරායවල් හා කඳවුරු ද නෝර්වේහි හිට්ලර්ගේ හමුදා භාරයට ගෙන තිබූ ප්‍රදේශ ද අතර සැපයුම් මාර්ග හා සන්නිවේදනය පවත්වාගැනීමට හැකි විය.

නෝර්වේ ආක්‍රමනය සිදු වූයේ යුද නැව් හා ගුවන් යානා උපයෝගී කරගෙන විශාල හමුදාවක් ගොඩබස්වා එරට නගර හා වරායවල් අල්ලා ගනිමිනි. ජර්මානු ආක්‍රමනයක් පිලිබඳ නොයෙකුත් සලකුනු තිබිය දී නෝර්වේජියානු හමුදා, නාසි කඩාවැදීම හමුවේ වැදගැන්මකට නැති වුව ද කල්වේලා ඇතිව බලමුලු ගන්වා නොතිබුනි. නෝර්වේහි රජු හා ලේබර් පක්ෂයේ නායකත්වය යටතේ පැවති ආන්ඩුව, භීතියෙන් මුසපත්ව උතුරු දෙසට පලා ගියහ. හිටපු නෝර්වේජියානු ආරක්ෂක ඇමතියෙක් හා හිට්ලර්ට පක්ෂපාතී කුඩා පක්ෂයක නායකයා ද වූ විඩ්කුං ක්විස්ලින්, දේශපාලන රික්තය සිය වාසියට හරවා ගනිමින් අප්‍රේල් 10 තමන් අගමැති ලෙස ප්‍රකාශ කලේය.

ආක්‍රමනයේ මුල් දිනවල, බ්‍රිතාන්‍ය හා ජර්මානු නාවික හමුදා එකිනෙකා සමග සටන් වැදුනහ. වඩාත් දුබල ජර්මානු බල ඇනි වලට දැඩි හානි සිදු විය. එහෙත් ස්කැන්ඩිනේවියාව ආක්‍රමනයේදී නාසි හමුදා පෙන්වූ අධිෂ්ඨානය හමුවේ බ්‍රිතාන්‍යය වික්ෂිප්ත විය. ඊනියා "ප්‍රෝඩාකාරී යුද්ධයෙන්" මාස හයකට පසුව ජර්මානු හමුදා පෝලන්තය යටත්කරගෙන රට දෙකඩ කලේය.

# සියක් වසරකට පෙර: සමාජවාදී තරුන සමුලුවක් ස්විට්සර්ලන්තයේ බර්න් නගරයේදී පැවැත්වින

## 100 years ago: Socialist youth conference held in Bern, Switzerland

**1915** අප්‍රේල් 07දා ස්විට්සර්ලන්තයේ බර්න් නගරයෙහි පැවැත්වුන ජාත්‍යන්තර තරුන සමාජවාදීන්ගේ සමුලුව සිය කටයුතු නිමා කලේය. යුද්ධයට ගැති පක්ෂවල අනුමැතිය නොලැබුන ද තරුන සමාජවාදීන්ගේ සමුලුව, රටවල් දහයක නියෝජිතයින් 16 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පාස්කු කාලය පුරාවටම පැවැත්වින.

බල්ගේරියාවේ, ජර්මනියේ, ඩෙන්මාර්කයේ, ඉතාලියේ, නෙදර්ලන්තයේ, නෝරවේ, පෝලන්තයේ, රුසියාවේ ස්විට්සර්ලන්තයේ, ස්වීඩනයේ තරුන සංවිධානවල නියෝජිතයෝ ඒ අතර වූහ. තියුනු මතභේද වලින් ඉරීගොස් තිබුන සමුලුවේ සාකච්ඡාව මාධ්‍යගතව තිබුනේ, යුද්ධයේ ස්වභාවය ගැනය. සමාජ ප්‍රජාතන්ත්‍ර පක්ෂවල භූමිකාව ද සාකච්ඡාවන්ට බඳුන් විය.

සමුලුවේ දෙවන දිනයේදී රුසියාවේ හා පෝලන්තයේ නියෝජිතයන්ගේ තියුනු විවේචන මධ්‍යයේ යුද්ධය පිලිබඳ යෝජනාව ඉදිරිපත් විය. ඒ වන විට බර්න්හි ජීවත්ව සිටි රුසියානු විප්ලවවාදියෙකු වූ ව්ලැඩිමීර් ලෙනින්, සමුලුවට සහභාගී නොවුන ද රුසියානු නියෝජිතයින් සමග සමීපව කටයුතු කලේය.

සියල්ලටත් වඩා, දෙවන ජාත්‍යන්තරයේ සමාජ ස්වෝත්තමවාදයෙන් මුලුමනින්ම කැඩී වෙන් වීමේ අවශ්‍යතාව ගැන අවධානය නොදක්වාම සම්මත කල යෝජනාව ඔවුහු හෙලාදුටුවෝය. 1914 අගෝස්තුවේ පලමු ලෝක යුද්ධය පිපිරීමත් සමග දෙවන ජාත්‍යන්තරයේ සියලු ශාඛාවන්ම පාහේ තමන් පූර්වයෙන් දරා සිටි සමාජවාදී ජාත්‍යන්තරවාදී ක්‍රියාමාර්ගය පාවා දෙමින් "තමන්ගේම" ආන්ඩුවල කොල්ලකාරී යුද ව්‍යායාමයට සහාය දුන්හ.

බහුතරයකගේ ඡන්දය ලැබූ යෝජනාවට, යුද්ධය පිලිබඳ වියුක්ත විවේචන ඇතුලත් වුව ද එයට විරුද්ධ විය හැකි විප්ලවවාදී විධික්‍රමයන් පිලිබඳ ප්‍රශ්නය මගහැරී අතර රුසියානුවන් ද ඇතුලු නියෝජිතයන් ගනනාවක් ඊට විරුද්ධව ඡන්දය දුන්හ.